ලිංගිකත්වය සඳහා අවසර ලබාදීමේ හැකියාවක් නොමැති බාලවයස්කරුවන් ලෙසින් හැඳින්වෙන වයස අවුරුදු 16 ට අඩු දරුවෙකු හෝ දැරියක හා ලිංගික හැසිරීම් සිදු කිරීම නීතිය ඉදිරියේ දඬුවම් ලැබිය හැකි වරදක් ලෙසින් දැක්වේ. එහිදී එම බාලවයස්කරුවන්ගේ කැමැත්ත හෝ අකමැත්ත අදාළ නොවේ.
එසේ නම් එවැනි පුවතක් වාර්තා කිරීමේදී, එම අපරාධයේ සැබෑ බරපතලකම ඉදිරිපත් කිරීමේ සමාජ වගකීමක් මාධ්‍ය අත තිබේ.
කෙසේ නමුත් කණගාටුවට කරුණ වන්නේ, එම මාධ්‍ය වගකීම පැහැර හැරෙනා අවස්ථාවන් වඩ වඩාත් බහුල වශයෙන් මෑත කාලයේදී දක්නට ලැබීමයි. ඊට උදාහරණයක් ලෙසින් දිවයින (07/19) පුවත්පතේ වූ "බාලවයස්කාර දැරිය තරුණයන් ගෙන්වාගෙන අනග රඟුම් පාලා" යන සිරස්තලයෙන් යුතු පුවත දැක්විය හැක. පැහැදිලිවම 'ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක්' ලෙසින් හැඳින්විය හැකි මෙම සිදුවීමේ සැබෑ බරපතල බව සැහැල්ලු කොට දැක්වීමත්, වින්දිත බාලවයස්කාරිය වෙත සිදුවීමේ දෝෂාරෝපණය පැටවීමත් මෙහි දක්නට ලැබේ.
මේ ඔස්සේ සිදුවන්නේ එවැනි අපරාධයන් සැහැල්ලු ලෙසින් සැලකීම ඔස්සේ ඊට වක්‍රාකාරීව වඩාත් අනුබල ලැබීම නොවේද? මෙය මාධ්‍යයේ සමාජ වගකීම පැහැර හැරීමක් මෙන්ම ආචාර ධර්මානුකූල නොවන වාර්තාකරණයක්ද නොවන්නේද?
#MediaEthicsSL #lka #sinhalanews #Divaina